# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1817/28 - 2013 ජූලි මස 03 වැනි බදාදා - 2013.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ**

3(1) වගන්තිය යටතේ දැන්වීම

**උතුරු/නැගෙනහිර පළාත්වල පැවති ත්‍රස්තවාදී ක්‍රියා හා ගැටුම් හේතුවෙන් අවතැන් වූ හා වෙනත් ස්ථානයක ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි නොවූ ශ්‍රී ලාංකික පුරවැසියන් 2012 ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කිරීම සඳහා වූ පරිපූරක ලැයිස්තුව**

***මැතිවරණ කොට්ඨාසය අංක - 10 - යාපනය***

ඉහත දැක්වෙන මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ අවතැන් වූවන් සඳහා වූ පරිපූරක ලැයිස්තුවේ වැඩ නිම කර ඇති බව සහ එම ලැයිස්තුව කාර්යාල වේලාවන්හි දී මහජනයාට පරීක්ෂා කර බලා ගැනීම පිණිස යාපනය/කිලිනොච්චිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බව 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3(1) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. යථෝක්ත අවතැන් වූ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත ප්‍රකාර ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසය අදාළ වූ එකී පරිපූරක නාමලේඛනයේ තම නම ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තා වූ එහෙත් තම නම පරිපූරක ලැයිස්තුවේ ඇතුළත්ව නොමැති කිසිවකු විසින් තමාගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ අවස්ථාචෝචිත පරිදි තමා විසින් අභියාචනා ඉදිරිපත් කර සිටින්නේ නම් එසේ අභියාචනා ඉදිරිපත් කර සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත පරිදි හඳුන්වාදී ඇති ආකෘති පත්‍රයෙන් වූ ඉල්ලීමක් යාපනය/කිලිනොච්චිය මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සතියක් ඇතුළත මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම යාපනය/කිලිනොච්චිය මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ලැබිය යුතු ය.

03. ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ලැයිස්තුවෙහි නම ඇතුළත් ව ඇත්තා වූ යම් කෙනෙකුට තමාගේ නම හෝ එකී නාමලේඛනයේ නම සඳහන් වී ඇත්තා වූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කර තිබීම ගැන හෝ තිබෙන්නට හැරීම ගැන හෝ විරුද්ධතාවය දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාවයන් යථෝක්ත පනතේ නියම කර ඇදි පරිදි අවස්ථාචෝචිතව "ඊ " ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යාපනය/කිලිනොච්චිය මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට සතියක් ඇතුළත යාපනය/කිලිනොච්චිය මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතු ය.

මෙම දැන්වීම යාපනය/කිලිනොච්චිය මැතිවරණ කාර්යාලයේ 2013 ජූලි මස 03 වැනි දින සිට 2013 ජූලි මස 09 වැනි දින දක්වා ප්‍රදර්ශනය කරනු ඇත.

04. යම්කිසි අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා ද යම්කිසි කෙනකුගේ නමක් නාමලේඛනයේ ඇතුළත් කරන ලෙස හෝ තිබෙන්නට හරින ලෙස හෝ වෙන යම් කෙනෙකු විසින් කරනු ලබන ඉල්ලීමක් සඳහා විරුද්ධතාවයක් දැක්වීම සඳහා ද, අවශ්‍ය ආකෘති පත්‍ර යාපනය/කිලිනොච්චිය පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් මැතිවරණ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඒ. ඕ. එම්. නෆීල්,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාසය අංක 10 - යාපනය.

2013 ජූලි මස 03 වැනි දින,
යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී ය.

07 - 518/1

---

**2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ**

3(1) වගන්තිය යටතේ දැන්වීම

***උතුරු/නැගෙනහිර පළාත්වල පැවති ත්‍රස්තවාදී ක්‍රියා හා ගැටුම් හේතුවෙන් අවතැන් වූ හා වෙනත් ස්ථානයක ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි නොවූ ශ්‍රී ලාංකීක පුරවැසින් 2012 ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කිරීම සඳහා වූ පරිපූරක ලැයිස්තුව***

***මැතිවරණ කොට්ඨාසය අංක - 11 - වන්නි***

ඉහත දැක්වෙන මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ අවතැන් වූවන් සඳහා වූ පරිපූරක ලැයිස්තුවේ වැඩ නිම කර ඇති බව සහ එම ලැයිස්තුව කාර්යාල වේලාවන්හි දී මහජනයාට පරීක්ෂා කර බලා ගැනීම පිණිස මන්නාරම/වවුනියාව/මුලතිව් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බව 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3(1) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. යථෝක්ත අවතැන් වූ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත ප්‍රකාර ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසය අදාළ වූ එකී පරිපූරක නාමලේඛනයේ තම නම ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තා වූ එහෙත් තම නම පරිපූරක ලැයිස්තුවේ ඇතුළත්ව නොමැති කිසිවකු විසින් තමාගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි තමා විසින් අභියාචනා ඉදිරිපත් කර සිටින්නේ නම් එසේ අභියාචනා ඉදිරිපත් කර සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත පරිදි හඳුන්වාදී ඇති ආකෘති පත්‍රයෙන් වූ ඉල්ලීමක් මන්නාරම/වවුනියාව/මුලතිව් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට සතියක් ඇතුළත මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම මන්නාරම/වවුනියාව/මුලතිව් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ලැබිය යුතු ය.

03. ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ලැයිස්තුවෙහි නම ඇතුළත් ව ඇත්තා වූ යම් කෙනෙකුට තමාගේ නම හෝ එකී නාමලේඛනයේ නම සඳහන් වී ඇත්තාත වූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කර තිබීම ගැන හෝ තිබෙන්නට හැරීම ගැන හෝ විරුද්ධතාවය දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාවයන් යථෝක්ත පනතේ නියම කර ඇදි පරිදි අවස්ථාවෝචිතව "ඊ " ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට මන්නාරම/වවුනියාව/මුලතිව් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ඉදිරිපත් කළ යුතු ය. නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට සතියක් ඇතුළත මන්නාරම/වවුනියාව/මුලතිව් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතු ය.

මෙම දැන්වීම මන්නාරම/වවුනියාව/මුලතිව් මැතිවරණ කාර්යාලයේ 2013 ජූලි මස 03 වැනි දින සිට 2013 ජූලි මස 09 වැනි දින දක්වා ප්‍රදර්ශනය කරනු ඇත.

04. යම්කිසි අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා ද යම්කිසි කෙනකුගේ නමක් නාමලේඛනයේ ඇතුළත් කරන ලෙස හෝ තිබෙන්නට හරින ලෙස හෝ වෙන යම් කෙනෙකු විසින් කරනු ලබන ඉල්ලීමක් සඳහා විරුද්ධතාවයක් දැක්වීම සඳහා ද, අවශ්‍ය ආකෘති පත්‍ර මන්නාරම/වවුනියාව/මුලතිව් පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් මැතිවරණ කාර්යාලයේ ලබා ගත හැකිය.

ඒ. එම්. එම්. කබීර්,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාසය අංක 11 - වන්නි.

2013 ජූලි මස 03 වැනි දින,
වවුනියාව මැතිවරණ කාර්යාලයේ දී ය.

07 - 518/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.